# ගජමෑන් ගෙනා කැමිලස්





## කැමිලස් පෙරේරා

*මීගමුව නගරයේ විසූ රජයේ සේවකයකු වූ කුරුකුලසූරිය තෝමස් ඇල්ෆ්‍රඩ් පෙරේරා සහ කුරුකුලසූරිය මේබල් බර්ඩි රෙජිනා ප්‍රනාන්දු යුවලගේ පළමු පිරිමි දරුවා ලෙස කුරුකුලසූරිය එලිජියස් කැමිලස් පෙරේරා මෙළොව එළිය දුටුවේ 1939 දෙසැම්බර් මස 07 දා මීගමුවේදීය. මීගමුව වැල්ලවීදියේ රෝමානු කතෝලික සිංහල මිශ්‍ර පාසලෙන් 'අ' යනු 'ආ' යනු කියැවූ කැමිලස් පසුව මීගමුවේ මාරිස්ටෙලා විද්‍යාලයට ඇතුළත් කරනු ලැබූ අතර පාසල් අධ්‍යාපනය අවසන් කරනු ලැබුවේ නිවෙස ආසන්නයේම පිහිටි මීගමුව ශාන්ත මේරි විද්‍යාලයෙනි.*

*බාල කාලයේ පටන් රේඛා චිත්‍ර ඇඳීමෙහි හපනෙකු වුවද පාසල් කාලය පුරාවට ඔහුගේ ගණුදෙනුව සිදුවන්නේ පාපන්දු ක්‍රීඩාවත් සමගය. පාසලේ පමණක් නොව ප්‍රදේශයේ ක්‍රීඩා සංගම්වල පාපන්දු කණ්ඩායම්වලද ඉදිරිපෙළ ක්‍රීඩකයකු වූ කැමිලස්, පාසල් අධ්‍යාපනය අවසන සිය ප්‍රථම රැකියාව වශයෙන් තෝරාගන්නේ සැලසුම් ශිල්පී තනතුරකි. 1960 වසරේ මීගමුව කච්චේරියේ සැළසුම් ශිල්පියකු ලෙස රැකියාවට බැදෙන ඔහු පසුව කොළඹට ස්ථාන මාරුවක් ලබා පැමිනීම ඔහුගේ ජීවිතය නව මගකට යොමුකළ සිදුවීමක් විය.*

*කොළඹ කච්චේරියේ සේවය කරන අතරම පුවත්පත්වලට කාටූන් ඇදීමට යොමුවන කැමිලස් 'දවස' සහ 'ලේක්හවුස්' පුවත්පත් ආයතනවල කාටූන් ශිල්පියෙකු ලෙස දීර්ඝ කාලයක් සේවය කළේය. ලංකාවේ ප්‍රථම චිත්‍ර කතා පත්තරය වූ 'සතුට' ට ඔහු විසින් නිර්මාණය කරනු ලැබූ කාටූන් චරිතය වූ 'ගජමෑන්' පාඨකයන් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත්වූ අතර පසුකාලයේ එය කැමිලස්ගේ අනන්‍යතා ලකුණ බවට පත්විය.*

*'කැපිල්ල'ට හසුව ලේක්හවුස් ආයතනයේ රැකියාව අහිමිවීමෙන් පසු කෙටි කාලයක් 'අද' නමැති දේශපාලන පුවත්පතේ කාටූන් ශිල්පියා ලෙස රැකියාව කළ කැමිලස් එතැනින් ඉවත්ව 1975 වසරේදී 'සිත්තර' චිත්‍රකතා පත්‍රයට සම්බන්ධ විය. එවක අති විශාල අලෙවියක් තිබූ 'සිත්තර' පුවත්පත ප්‍රකාශයට පත්කළ මල්ටි පැක්ස් ආයතනයෙන් ඉවත්වන කැමිලස් පසුව 'කැමිලස් ප්‍රකාශන' නමින් තමන්ගේම සමාගමක් ගොඩනගා එහි ප්‍රථම ප්‍රකාශනය වූ 'සත්සිරි' හි කර්තෘවරයා බවට පත්විය. ඒ 1986 නොවැම්බර් 26 වෙනිදාය.*

*කාලයාගේ ඇවෑමෙන් චිත්‍රකතා පත්තර අලෙවිය අඩුවී ඒ ව්‍යාපාරය කඩා වැටෙන්නට පටන් ගනිද්දී ළමා පුවත්පත් සහ වෙනත් අධ්‍යාපනික ප්‍රකාශන කෙරෙහි යොමුවූ හේ මේ වන විට එකී ක්ෂේත්‍රයේ සාර්ථකත්වයට පැමිණ සිටින්නේය. 'සම්මාන', 'ඩිංකි', 'රුසියා', 'පුංචි බට්ති' කැමිලස්ගේ ගජමෑන් සමඟ ප්‍රකාශයට පත් කෙරුණු අධ්‍යාපන ප්‍රකාශන කීපයකි. එහෙත් කාටූන් ශිල්පියෙකු ලෙස ද සිය අනන්‍යතාවය තවදුරටත් රැක ගනිමින් 'රිවිර' පුවත්පතට සම්බන්ධවී සිටින කැමිලස් 'රිවිර ඉරිදා සංග්‍රහය' සහ දිනපතා 'රිවිර' පුවත්පත්වලට අඳින කාටූන් අදටත් අදටත් පෙරසේම ජනප්‍රියය. 1969 වසරේදී සිය ගම් ප්‍රදේශයේම තරුණියක වූ කොන්සිලියා පෙරේරා සමඟ විවාහ වූ කැමිලස් දෙදරු පියෙකි. මයුරි පෙරේරා සහ ගයාන් පෙරේරා කැමිලස්ගේ දුහිතෘයෝ වෙත්.*

camipub@eureka.lk *ඔහුගේ විද්‍යුත් තැපැල් ලිපිනයයි.*

**'ගජමෑන්' ලංකාවේ කාටූන් කලාවේ අමරණීය චරිතයක්. මීට දශකයකට දෙකකට කලින් නම් 'ගජමෑන්' නොහඳුනන සිංහල පාඨකයෙක් හිටියා කියලා හිතන්නත් බෑ. මේ කාටූන් චරිතය නිර්මාණය කෙරුණේ මොන විදිහටද ?**

ඔය වෙනකොට මම ලේක්හවුස් එකේ 'ජනතා' පත්තරේට කාටූන් අඳිනවා. 'දොං සේතං' තමයි 'ජනතා'වට ඇන්දේ. හැත්තෑ දෙකේ ලේක්හවුස් එකෙන් චිත්‍ර කතා පත්තරයක් පටන් ගත්තා. ඒකේ නම 'සතුට'. 'සතුට' තමයි ලංකාවේ පළවෙනිම චිත්‍රකතා පත්තරේ. 'සතුට' පත්තරේ ආරම්භක කර්තෘ විදිහට තෝරාගෙන තිබුණ ඒ වෙනකොට 'ජනතා' පත්තරේ කර්තෘවෙලා හිටිය සමරසිංහ. 'සතුට' පත්තරේ ප්ලෑන් කරන වෙලාවේ එයා මට කතා කරලා කිව්වා ඒ පත්තරේට කාටූන් කතාවක් අඳින්න කියලා. ඒ වෙනකොට මම සිළුමිණ පත්තරේට 'සිරිබිරිස්', අඳිනවා. ජනතා පත්තරේට 'දොං සේතං, අඳිනවා. සරසවිය පත්තරේට 'දැක්කොත් පද්මාවතී' අඳිනවා. දැන් සතුට පත්තරේට මොකක් හරි අලුත් චරිතයක් අඳින්න ඕනේ කියලා කල්පනා කර කර ඉන්න අතරේ දවසක් මම වැඩ ඇරිලා කෝච්චියෙන් ගෙදර යන වෙලාවේ එක සැරේම මගේ ඔලුවට ආවා 'ගජමෑන්' ගේ රූපය. රූපයත් එක්ක ඔලුවට ආව නම 'රජ මෑන්'. පස්සේ රූපය අඳිනකොට නම සංශෝධනය වුණා 'ගජමෑන්' කියලා. 1972 අගෝස්තු මාසේ තමයි ඔන්න ඔය විදිහට ගජමෑන් ඉපදුනේ.

**ඔබ එක්තරා ආකාරයට විශේෂ වර්ගයේ කාටූන් පියෙක් කියලා හඳුන්වන් පුළුවන්. ඔබට කාටූන් පවුලක්ම ඉන්නවා. 'සිමෝනා', 'මගෝඩිස්තුමා', 'ලපයා', 'සෙල්ලම් සේන', 'ගොඩ්ඩින්' වගේම මේ පවුලේ තවත් සාමාජිකයන් ගණනාවක්ම ඉන්නවා. කොහොමද මේ පවුල ගොඩනැගුණේ.?**

එකින් එක තමයි චරිත එකතුවුණේ. මුලින්ම ඇඳපු චරිතය තමයි 'තෙපානිස්'. ඒ 1966 අවුරුද්දේ 'දවස' පත්තරේට. ඊට පස්සේ 'ජනතා' පත්තරේට 'දොං සේතං' නිර්මාණය කළා. ඔය විදිහට ඒ ඒ පත්තරේ හැටියට ගැලපෙන චරිත තමයි නිර්මාණය කළේ. 'සරසවිය'ට දැක්කොත් පද්මාවතී ඇන්දා. අන්තිමේ කාටූන් පවුලක් හැදුනා.

**කාටූන්වලින් බොහෝ තැන්වල කෙරෙන්නේ හාස්‍ය මතුකරන එක. මේ වෙනුවෙන් ඔබ කාටූන් චරිත නිර්මාණය කරන කොට හැබෑ ජීවිතයේදී හමුවෙන පුද්ගලයන් මුල්කරගැනීමක් කරනවාද?**

'ගොඩ්ඩින්' කියන චරිතය නිර්මාණය කළේ කෝච්චියේ යනකොට දැකපු පුද්ගලයෙක් මුල් කරගෙන. අනෙක් හැම චරිතයක්ම හිතෙන්ම මවාගත්ත චරිත. නම් දැම්මෙත් හිතෙන්. හැබැයි මට දැනගන්ඩ ලැබුණා මගේ කාටූන් චරිතවල තියන නම්, පස්සේ හැබෑ මිනිස්සුන්ට දාලා තියනවා කියලා.

**කාටූන් ශිල්පීන්ට යම් යම් අවස්ථාවල විවිධ තර්ජන ගර්ජනවලට මුහුණ පාන්න සිද්ධවෙනවා. ඔබට ඒ වගේ අවස්ථාවලට මූණ දෙන්න වෙලා තියනවාද ?**

ශ්‍රීලාල් සෙනෙවිරත්න

මට කාටූන් නිසා කිසිම දවසක කිසිම තර්ජණයකට මුහුණ දෙන්න වෙලා නෑ. මම කාටූන්වලින් හාස්‍ය මතුකරන්නේ උපහාසය යොදාගෙන. ඒක හරියට තොප්පි හැදිල්ල වගේ. කැමතිනම් කැමති කෙනෙකුට තොප්පිය දාගන්න පුළුවන්. නමුත් තොප්පිය හදන්නේ හරියටම මෙන්න මෙයාට කියලා නෙවෙයි. මම අඳින 'මගෝඩිස්තුමා' කියන චරිතයෙන් සංකේතවත් වෙන්නේ දේශපාලකයා. මගෝඩියා කියන වචනය අරගෙන තමයි ඒ නම හැදුවෙත්. නමුත් මගේ කාටූන් එක බැලූ පමණින් කාටවත් ස්ථිරවම කියන්න බෑ මේ අන්න අර දේශපාලකයා කියලා. සමහර වෙලාවට දෙබස-'වලින් දේශපාලකයා කවුද කියලා හැඟවෙන්න පුළුවන්. නමුත් ඒක සෘජුව කියාපෑමක් නෙවෙයි. ඒ නිසා කෙනෙකුට මේක ඇඟට ගන්න වගේම තව කෙනෙකුට ඇඟට නොගෙන ඉන්නත් පුළුවන්. මම හිතන්නේ ඔය තර්ජනවලට මූණ දෙන්න වෙන්නේ උපහාසය වෙනුවට කාටූන්වලින් අපහාසය මතුකරාම කියලයි.

**ඔබ කොහොමද මේ කාටූන් කලාවට යොමුවෙන්නේ ?**

1960 මම රස්සාවේ ස්ථානමාරුවක් ලැබිලා කොළඹට ආවා. රස්සාව කරන අතරේ පොකට් කාටූන් ඇඳලා පත්තර කන්තෝරුවලට අරගෙන යනවා. මුලින්ම ලේක්හවුස් එකට තමයි අරගෙන ගියේ. වේල්ලවීදියේ කච්චේරියේ ඉඳලා කෑම පැයේ පයින්ම යනවා ලේක්හවුස් එකට කාටූන් අරගෙන. පොකට් කාටූන් මිටි ගනන් ගෙනියනවා. ඉඳලා හිටලා එකක් දෙකක් තමයි මුල් කාලෙදි පළවුණේ. මුලින්ම කාටූන් එකක් ඇන්දේ 1964 අන්දරේගේ කවියකට. ඔහොම යනකොට දවසක් මම අඳුරන කෙනෙක් කිව්වා ඕක හරියන්නේ නෑ. වෙන පත්තරේකට ඇඳලා නමක් හදාගෙන ලේක්හවුස් එකට එන්න. එතකොට තමයි මෙහෙ පළකරන්නේ කියලා. ඉන් පස්සේ මම කාටූන් ඇඳගෙන දවස පත්තරේට ගිහින් දෙන්න පටන් ගත්තා. මම ඇන්ද පොකට් කාටූන් බලලා දවසේ කර්තෘ කිව්වා මෙහෙම නෙවෙයි තීරු කාටූන් එකක් අඳින්න කියලා. තීරු කාටූන් කියන්නේ මොකක්ද කියලා ඒ වෙනකොට මම දැනගෙන හිටියෙත් නෑ. ඔය විදිහට තමයි රූපරාමු කීපයක 'තීරු කාටූන්' අඳින්න පටන් ගත්තේ. මුලින්ම ඇන්දේ 'තෙපානිස්'. ඒවා දවස පත්තරේ පළ වුණා. මාස කීපයක් මේ විදහට මගේ කාටූන් දවස පත්තරේ පළවෙනකොට දිනමිණ පත්තරේ කර්තෘ පියසේන නිශ්ශංක කතා කරලා කිව්වා කාටූන් ශිල්පියෙක් විදිහට රස්සාවට ලේක්හවුස් එකට එන්න කියලා. ඒ වෙනකොට මාස ගානක් කාටූන් ඇඳලත් දවසෙන් කිසිම ගෙවීමක් කරලා තිබුණේ නෑ. ඒ නිසා දවසට ඇඳිල්ල නතර කරලා මම ලේක්හවුස් එකට ගියා. මුලින්ම ජනතා පත්තරේට 'දොං සේතං', 'සිමෝනා' ඇන්දා. කාටූන් එකකට රුපියල් පහ ගානේ ලේක්හවුස් එකෙන් මට ගෙව්වා.

**කාටූන් ඇඳීමේ හැකියාව දියුණු කර ගත්තේ කොහොමද ?**

ඇඳලා, ඇඳලාම තමයි. නැතුව කොහෙන්වත් වෙනම හැදෑරීමක් කළේ නෑ. ඒ කාලේ හිටියා කොලට් කියලා කාටූන් ශිල්පියෙක්. මම මුලින්ම කාටූන් ඇන්දේ එයාගේ කාටූන් දිහා බලාගෙන. පස්සේ මගේම ශෛලියක් නිර්මාණය කර ගත්තා. මට පොඩි කාලේ ඉඳලා චිත්‍ර අඳින්න තිබුණ දක්ෂතාවය මේකට උදව් වුණා. මම පුංචි කාලේ, මට මතකයි අපේ ගෙවල් පැත්තේ